

## ‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු

| | | |
|---|---|---|
| 55 වන කාණ්ඩය | බු.ව. 2556 ඉල් මස පුරපසළොස්වකදා<br>ක්‍රි.ව. 2012 නොවැම්බර් මස 27 වන දා | 07 වන කලබ |

න විස්සසෙ එකතියෙසු එවං
අගාරිසු පබ්බජිතෙසු චා'පි
සාධු'පි හුත්වාන අසාධු හොන්ති
අසාධු හුත්වා පුන සාධු හොන්ති

(සාරිපුත්තථෙරගාථා)

නො තබන්න විස්වස් එකැතින්
පැවිදි - නොපැවිදි කිසිවකුන් වෙත
හොඳ අය නරක වෙති
නරක අය යළි හොඳ වෙති

**- අනඳ**



# සැරියුත්
# මහ රහතන් වහන්සේ

බම්බලපිටිය සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් වහන්සේ විසිනි.**

''යමෙක් සිල්වත් නම්, මැනැවින් සිහිය පවත්වාගන්නට සමත් නම්, ධ්‍යාන වලට ඇලී සිතිවිලි දමනය කරමින් ධර්මයේ අප්‍රමාදී ව හැසිරෙමින් භාවනාවේ යෙදෙනවා නම්, එලෙස සමාධිමත් සිතකින් හුදෙකලා ජීවිතයෙන් සතුටුවන්නා තමයි මේ ලොව 'භික්‍ෂුව' ලෙස හැඳින්විය හැක්කේ.

ථේර ගාථා පාළියේ සඳහන් මේ උදාන පූර්විකාව මහා පඤ්ඤ සාරිපුත්ත මහරහතන් වහන්සේ ගේ මැයි.

මෙයින් ඒකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට පෙර අනෝමදස්සී බුදුරදාණෝ ලොවැ පහළ වූහ. එදවස මහාසාර කුලයෙහි සරද නම් මානවක තෙමේ උප්පත්තිය ලැබී ය. ඔහුගේ කුඩා දිවිය කෙළි දෙලෙන් ගතවූ අතර මැදි විය එළඹීමත් සමඟ මෙසේ සිත් විය. ''මම මේ ආත්මය පමණක් දනිමි. පරලොව ආත්මභාව ගැන නොදනිමි. උපන් සත්වයනට මරණය ඒකාන්තමැයි '' මෙසේ ජීවිතයේ නිසරු බව සලකා සසර දුකින් මිදීමට පියාගේ ඇවෑමෙන් ලැබුණු රුවන් ගබඩාව දුගී මගීන්ට දන් දී හිමාල වනයට ගොස් ඍෂි පැවිද්දෙන් පැවිදි විය. නොබෝ කලෙකින් අෂ්ට සමාපත්ති උපදවා ගත්තේ ය.

ඉනික්බිත්තෙන් ඒ මග ගෙන තවත් සැත්තෑ සතර දහසක් මාණවකයෝ සරද තවුසන් ළග පැවිදි වැ අෂ්ට සමාපත්ති ලැබ ගත්හ.

එසඳ අනවමදර්ශී බුදුරජාණන් වහන්සේ සරද තවුස් ගේ වාසනා ශක්තිය බුදු නෙතින් දැක ඔහුට යහපතක් සිදු කිරීම පිණිස හුදෙකලාව අහසින් තවුසා සිටි තැනට වැඩම කළහ. මේ මොහොතේ අනෙක් තවුසෝ පලවැල සඳහා පිටතට ගොස් හුන්හ. සරද තවුස් තෙම ලක්ෂණ ශාස්ත්‍රයේ ලත් දැනුමින් ඒකාන්තයෙන් මේ නම් බුදුවරයෙකු බැව් වටහාගෙන පෙර ගමන් කොට පසඟ පිහිටුවා වැඳ භාග්‍යවතුන් වහන්සේට අසුන් පනවා තෙමේ ද එකත් පස්ව සිටියේ ය. පලවැල නෙලා පැමිණි ගෝල පිරිසට තම ආචාරීන්ට වඩා උසස් තවත් කෙනෙකු මේ ලොව වසනවා දැයි කුකුසක් උපන. මෙයට පිළිතුරු වශයෙන් සරද තවුස් තෙම දරුවනි, තොපට අබ ඇටයක් සමඟ සැට අට ලක්ෂයක් යොදුනැති මහාමේරුව සම කරන්නට හැකි දැයි විමසූ කල ඒකාන්තයෙන් ම මේ තෙමේ අප ගුරු සරද තවුසාට වඩා උසස් කෙනෙකැයි අවබෝධ ව භාග්‍යවතුන් වහන්සේට වැඳ බුහුමන් දැක්වූහ.

ගරු ආරාධනයෙන් භාග්‍යවතුන් වහන්සේ මිහිරි එලවලින් පුදන ලදහ. බුදුහු එම පාත්‍රය පිළිගත් සැණින් දෙවියෝ දිව්‍ය ඕජස දානයට මිශ්‍ර කළෝ ය. දන් කිස අවසන බුදුරජාණන් වහන්සේ නොබෝ වෙලාවකින් මාගේ අගසව් දෙනම වහන්සේ සමඟ ලක්ෂයක් භික්ෂු සංඝයා සෘද්ධියෙන් වඩින සේක්වා යි අදිටන් කළහ.

මේ මහා සංඝ සන්නිපාතය සිදුවූ සැණින් සරද තෙම ඇතුළු පිරිස සෘද්ධියෙන් මල් අසුන් පැනවූහ. බුදුරදුන් හට යොදුනක් උසැති මලසුනක් පිළිගැන් වූහ. බුදුන් ප්‍රමුඛ සියලු

භික්ෂුහු නිරෝධ සමාපත්තියට සම වැද සතියක් එතැන වැඩ සිට සතිය ඉක්ම වූ පසු අගසවු දෙනමට මේ මල් අසුන් පූජාවේ අනුසස් දේශනා කරන ලෙස භාග්‍යවතුන් වහන්සේ සැළ කළහ. දෙදෙනා වහන්සේම දම් දෙසුවත් එකදු තවුසෙක් වත් ධර්මාවබෝධය නොලද්දේ ය. අනතුරුව බුදුහු අනුමෙවැනි බණවර දෙසූ අතර සරද තවුස් හැර හැත්තෑ හතර දහසක් තවුසෝ රහත් වැ එහි භික්ෂු භාවයෙන් පැවිදි වූහ.

සරද තවුස් තෙම බුදු පාමුල වැඳ වැටී, ''ස්වාමීනී, ඔබ වහන්සේ ළඟ දෙවන අසුනෙහි වැඩ සිටින මේ නිසභ තෙරුන් මෙන් මාද කිසියම් බුදු කෙනෙකුගේ ශාසනයේ ප්‍රඥාවෙන් අගතැන්පත් ශ්‍රාවකයෙකු වීමට ප්‍රාර්ථනා කරන බැව් සැළ කළහ.

ඔහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධිමත් වන දන බුදුරජාණන් වහන්සේ 'පිනැතිය, මෙයින් අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයකට පසු ඔක්කාක කුලයේ ඉපිද ගෞතම නමින් බුදුකෙනෙක් ලොවැ පහලවෙති. ඔබ වනාහි උන්වහන්සේ ගේ දම් සෙනෙවි සැරියුත් තෙරහු වන්නාහ යි පවසා සඟ පිරිස සමඟ එතැනින් පෙරළා වැඩියහ. සරද තව්සා සිව්බඹ විවරණ වඩා මරණින් මතු බඹලොව උපත ලද්දේ ය.

සාරිපුත්ත මහරහතන් වහන්සේ ගේ අතීත කථාව මෙය වේ.

අප කථානායකයාණෝ ගෞතම බුදුරජාණන් වහන්සේ පහළ වන්නට ප්‍රථම රජගහ නුවරට සමීප උපතිස්ස නම් බමුණු ගමේ සාරි නම් බැමිණියට පුත් ව උත්පත්තිය ලබා කුඩා කල ගෙවුණු පසු සංසාරගත පුරුද්ද ඉස්මතුව සිතෙහි පැන නැංගහ. ඒ සඳහා පරිසර සාධකද හේතු සාධක විය. උත්සව කෙළියේ පසුපස ඇති මායාවත් එහි නිසරු බවත්

දැන ජීවිතයේ සැනසීම ලබන්නට ගිහි ගෙයින් නික්ම සංජය පිරිවැජියා ළඟ පැවිදි විය. තමන් සොයන විමුක්තිය ඔහු ළඟත් නොමැති කල එයින් නික්ම යන ගමනේ දී භාග්‍යවතුන් වහන්සේ ගේ ප්‍රථම රහත් හැට නම අතර සිටි අස්සජි මහ තෙරුන් දැක ''ස්වාමීනි, ඔබ වහන්සේ කවුරුන් උදෙසා පැවිදි වූ සේක් දැයි විමසී ය. ස්වාමී වු සර්වඥයන් වහන්සේ මාගේ ගුරු වන සේක. උන්වහන්සේ උදෙසා පැවිදි වූයෙමි'යි අස්සජී තෙරණුවෝ හෙළි කළහ.

ඉනික්බිතිව අස්සජි තෙරුන් ''කිසියම් හේතු ධර්මයක් නිසා හටගන්නා ඵලයක් ඇත් ද එකී ඵලයෙහි හේතුව කුමක් දැයි තථාගතයන් වහන්සේ වදාරන සේක. එම ඵලයෙහි අභාවයක් ඇති කල්හි එහි නිරෝධය ද උන්වහන්සේ ප්‍රකාශ කරන සේක. යනුවෙන් ප්‍රකාශ කළ අර්ථවත් පද සතර කන වැකුණු විගසින්ම සෝවාන් ඵලයෙහි පිහිටියේ ය.

නොබෝ කලකට පසුව තථාගතයන් හමුවේ පැවිදි වූ සැරියුත් මාහිමියන් වහන්සේ පහළොස්වන දින ඉක්ම යනවාත් සමඟ වේදනා පරිග්‍රහ සූත්‍රය කන වැකී සකලක්ලේශයන් ප්‍රහීණ කරන්නට සමර්ථ වූහ. ජේතවනාරාමයේ දී බුදුරජාණන් වහන්සේගෙන්, "මහා පඤ්ඤානං යදිදං සාරිපුතෙතා", මහා නුවණැතියන් අතර මා පුත් සාරිපුත්ත තෙමේ අග තැන්පත් වන්නේ ම ය යනුවෙන් අග තනතුරු ලදහ.

සසුන් කිස මනාව සිදුකරමින් මිත්‍යාදෘෂ්ටි අත් නොහළ තම මෑණියන් ද සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටුවා අද වැනි ඉල් පොහෝ දිනයක දී ඒ මහා බුද්ධ පුත්‍රයාණෝ පහන් සිළක් මෙන් නිවී ගියහ.

**(මනෝරථපූරණී (අඞගුත්තර නිකාය අට්ඨකථාව) ඇසුරින් සැකැසිණි)**



# දියුණුවේ දොරටු කියවමු

## (අත්ථස්සද්වාර ජාතකය)

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යන අංශාධිපති දර්ශනපති
**පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමිපාණන් විසිනි**

දරුවෙකුගේ තක්සලාව ගෙදරම වෙයි. එහි මහැදුරෝ දෙමාපියෝ ය. කුඩා කල දරුවන් විමසන දෑ පහදමින් ඔවුනට දැනුම දීමට දෙමාපියෝ උත්සුක වෙති. දෙගුරු යන නාමය ද දෙමාපියනට ලැබෙනුයේ මේ නිසාවෙනි. ''අම්මේ දිග කථාවක් කියන්නැ''යි දරුවෙකු අම්මාගෙ ඇඟෙහි එල්ලෙන විට කථා නොදත් ඒ අම්මා දුරකථනය කරකවා පුතුට ආච්චි, සීයා සම්බන්ධ කර දෙන එක්තරා වෙළෙඳ දැන්වීමක් අපි දකිමු. ඇතැම් විට පාසැලේ පොත පමණක් උගෙන, බාහිර සමාජ විඥානයෙන් තොර වූ රැකියාවට යන එන නූතන මව්පියවරුන් ගේ සැබෑ ස්වභාවය එයින් ධ්වනිත කරවයි. ඔවුහු දිග කථා නොදනිති. වැඩිහිටි පරපුර තවමත් යම්තමින් හෝ සමාජ විඥානය හඳුනා ගත්තෝ වෙති. ඔවුනගේ අභාවයෙන් පසු දරුවනට සුරංගනා කථා, රජ කථා අසන්නට දූරකථන සමාගම් පසුපස යෑමට සිදුවන අනාගතය වැඩි ඈතක නොවන බව සිහිපත් කරමු.

මුනිදාස කුමාරතුංග පඬිතුමන්ගේ ''පියසමර'' කාව්‍යය ඔස්සේ පාඨකයා අවදි කරන්නේ දෙමාපියන් සතු සමාජ දැනුම ශ්‍රේෂ්ඨ දරුවෙකු නිර්මාණය කරන්නට කරන ලද

බලපෑම සම්බන්ධයෙනි. විශේෂයෙන් පියා සැඳෑ කල පුතුගේ අත අල්වා ගෙන මිදුලෙහි ඇවිදුවමින් සොබා දහම ගැන, රජවරුන් සිටුවරුන් ගැන, ඉර හඳ තරු ගැන තම දැනුම දායාද කළ අයුරු ඉතා අපූර්ව ලෙස කුමාරතුංගයෝ පියසමරෙහි දක්වති. එවන් පියෙකු නො වන්නට කුමාරතුංග වැනි මහා දාර්ශනිකයෙකු, ශ්‍රේෂ්ඨ භාෂාවේදියෙකු, සිංහලයෙකු අපට අහිමි වී යන්නට තිබුණි. මේ අනුව දරුවා දාර්ශනිකයෙකු වනවා ද ත්‍රස්තවාදියෙකු වනවා ද යන්න තීරණය කෙරෙන්නේ දරුවා මුහුණ දෙන දෙමාපිය පරිසරයෙන් බව පැහැදිලි කරුණකි.

දරුවනට කථා මතු නොව දියුණුවට මඟ කියා දීම ද දෙමාපිය කාර්යභාරයකි. තම ජීවිතයේ අත්දැකීම් භාවිත කරමින් ඊළඟ පරපුර හැඩගැස්වීම දෙමාපියන් ගේ පරම යුතුකම වන්නේ ය. පාසලකට හෝ දහම් පාසලකට යැවූ පමණින් මෙම කාර්යය සිදු වෙතැයි අපේක්ෂා කිරීම මුළාවකි. දරුවන් ගේ දියුණුවට මඟ පෙන්වීමට දෙමාපියන් නොදන්නේ නම් ඒ සඳහා තමාට වඩා අත්දැකීම් බහුල වියත් පඬිවරයෙකු ගේ ඇසුර ලබා දීම කෙරෙහි ද බුද්ධිමත් දෙමාපියන් සැලකිලිමත් විය යුතු ය.

මෙම ජාතක කථාවෙන් විග්‍රහ කෙරෙන්නේ මෙතෙක් කළ පූර්විකාවට අදාළ ඉතා වැදගත් විවරණයකි. එනම් අත්ථස්සද්වාර ජාතකයයි. ධර්ම දේශකයන්ගේ ජනප්‍රිය මාතෘකාවක් ද වී ඇති මේ ජාතකය නාම මාත්‍රයෙන්ම පැහැදිලි වන්නේ අර්ථ සිද්ධිය ඇති කරලීමට අදාළ දොරටු විමසන ජාතක කථාවක් බවයි. මෙම කථාව අපට දායාද වන්නේ බුද්ධිමත් පුතෙකු පියෙකු වෙතින් ඇසූ ප්‍රශ්නයක් හේතුවෙනි. පියවරුන් වෙතින් විවිධ ප්‍රශ්න නඟන දරුවන් අතර මෙහි පුතු පියාගෙන් විමසන්නේ තමාගේ ජීවිතයෙහි

දියුණුවට හේතුවන දොරටු විමසා දෙන ලෙසයි. ඊට අදාළ බොහෝ කාරණා කාරණ නොදත් එම පියා පුතු බුදුහිමියන් වෙතට රැගෙන ගොස් ''ස්වාමීනි, මේ කුමාරයා නුවණැත්තේව, කාරණා කාරණ දැන්මෙහි සමර්ථ ය. මේ තෙමේ මා වෙතින් අභිවෘද්ධියට කාරණා වූ ප්‍රශ්නයක් විචාළේ ය. බුදුරජාණන් වහන්ස, මට ඒ ප්‍රශ්නය වදාළ සේක් වී නම් යහපත් වන්නේ ය'' යනුවෙන් කියා සිටියේ ය.

පුතුට අභිවෘද්ධි කාරණා කියා දෙන්නට නොදත් ඒ පියා පුතු බුදුහිමියන් වෙත රැගෙන යෑම ඥානවන්ත ක්‍රියාවකි. තමා නොදත් දේ දන්නා කෙනෙකු වෙතින් හෝ ලබා දී බාල පරම්පරාව නිසි තැනට රැගෙන යෑම බුද්ධිමත් දෙමාපිය යුතුකමක් නොවන්නේ ද? බුදුහිමියෝ මෙම පුතුට දියුණුවේ දොරටු පෙන්වා වදාළහ. මෙම දොරටු ඒ පුතුට පමණක් නොව ලෝකයේ සියලු දෙනා වෙතටම අදාළ වූ සේ පෙනේ.

බුදුහිමියන් වදාළේ, අභිවෘද්ධියට හේතු වන සම්පත් උපදවන්නට, උපදවා ගත් සම්පත් නිසි ප්‍රයෝජන ලබන්නට ද හේතුවන කාරණා හයක් ඇති බවයි. එයින් පළමුවැන්න නීරෝගි බවයි. ''ආරෝග්‍යමිච්ඡේ පරමං ච ලාභං'' යනුවෙන් නීරෝගීකම ම පරම ලාභයක් කොට මෙහි වදාළහ. දරුවෙකු, තරුණයකු වුව නිතර නිතර පීඩා ගෙනෙන රෝගියෙකු වුවහොත් අධ්‍යාපනය ද රැකියාව ද ව්‍යාපාරය ද නිසි ලෙස ඉටු කළ නොහැකි වනු ඇත. ගිරිමානන්ද සූත්‍රයෙහි වදාළ පරිදි රෝගකාරක අටකි. එනම් සෙම්, වා, පිත් මුල් කොට හටගන්නා රෝග තුනකි. ඒවා එක්වර කිපීමෙන් හට ගන්නා සන්නිපාත අවස්ථාවකි. ඍතු වෙනස් වීමෙන් හට ගන්නා රෝග ද වේ. විෂම පැවැත්ම හේතුවෙන් ද කර්ම විපාකයෙන් ද තමාගේ ම උපක්‍රමයෙන් මිනිස්සු රෝගාබාධ ඇති කර ගනිති. නූතනයේ මිනිසා පෙළන සියලු රෝග මේ හේතුකාරක නිසා ය. එබැවින්

මේ පිළිබඳ අවබෝධය හා නිසි පැවැත්ම ඇති කර ගැනීමෙන් ම මෙම රෝගවලින් මිදී සිටීමට අපහසු නොවනු ඇත. මේ දියුණුවට හේතු වන පළමු දොරටුව වන්නේ ය.

දියුණුවට හේතුවන දෙවන දොරටුව වන්නේ මනා ආචාරශීලයෙන් යුක්තව ලෝක චාරිත්‍ර දැන ජීවිතය පවත්වා ගැනීමයි. එනම් ශීලාචාර බවයි. ලෝකයෙහි කුඩා කල සිටම කළ යුතු නොකළ යුතු දෑ වෙයි. ඒවා දැක්වෙන්නේ චාරිත්‍ර හා වාරිත්‍ර යනුවෙනි. කළ යුතු දෑ මගහරින්නා ද නොකළ යුතු දෑ වැලඳ ගන්නා ද පිරිහෙති. ආචාර විචාර නොදත් මිනිසා මංමුළා වූවෙකි. නිවසේ දී පාසලේ දී හෝ පිවිසෙන කවර තැනෙක හෝ ආචාර විචාර විමසා ජීවත් වන්නාට වරදින්නේ නැත. වරද්දා ගත්තෝ විමසත්වා.

දියුණුවේ තෙවැනි දොරටුව ඥාන වෘද්ධ, වයෝ වෘද්ධ, තපෝ වෘද්ධ වූ ගුරුවර වැඩිහිටියන් වෙතට පැමිණ අවශ්‍ය උපදේශ ගුරුහරුකම්, අවවාද ලබා ගැනීමට ක්‍රියා කිරීමයි. මැරෙන තුරා මිනිසාට උගත යුතු දේ වෙයි. බුදුරදුන්ගෙන් මෙහා සියල්ල දත්තෙකු අපට නැත. එබැවින් තමා සියල්ල දන්නා කෙනෙකු සේ නොහැසිර තමාට වඩා යමක් දන්නා විශේෂඥයන් වෙතින් කරුණු දැන ගැනීම යහපතක්ම ඇති කරවයි. ජීවිතය පුරාවටම ගුරුවරයෙකු අවශ්‍ය බව මෙයින් කියැවේ. පොතපතකට පවා ළං වන්නේ කාරණා කාරණ දැන ගැනීමේ උවමනාවෙන් ම නම් එය දියුණුවේ දොරටුවක් වන්නේ ය.

දියුණුවෙහි හතරවන දොරටුව ලෙස බහුශ්‍රැත බව දක්වෙයි. එනම් ලෝක ඥානය සොයා යෑමයි. ඒ සඳහා බොහෝ දේ ඇසිය යුතු බවයි. පුරාණ ශෝත්‍රෘ සමාජයේ ඇසීම ප්‍රබල ඉගෙනීමේ ක්‍රමවේදයක් විය. ඇසෙන දේ දරා තමනට රුචි

ලෙස පරිකල්පනය කර ගනිමින් ජීවිතය පවත්වා ගෙන යෑමට උත්සාහ කිරීම ඥානවන්ත බව විය. සුනාථ, ධාරෙථ, චරාථ යන වචන කියැවුණේ ඒ නිසාවෙනි.

ත්‍රිවිධ දුශ්චරිතයෙන් ඈත්වී ත්‍රිවිධ සුචරිතය වැඩීම දියුණුවෙහි පස්වන දොරටුව වන්නේ ය. කය, වචනය හා සිතිවිලි ඔස්සේ කෙරෙන ක්‍රියාවන් යහපත් ලෙස පවත්වා ගෙන යෑම මෙයින් අපේක්ෂා විය. කායික හෝ වාචසික ක්‍රියාවන් දුෂ්ට ලෙසම සිදු කරන පිරිස් අවමානිත මිනිස්සු වන්නෝ ය. සිතිවිලි දුෂ්ට කරගැනීම බරපතළ සමාජ ව්‍යසනයකි. එවන් වූවෝ සැමදා කඳුළු පිරි දෙනෙතින්ම දිවි ගෙවති. දියුණුවක් නම් සිදු නොවන්නේ ය.

දියුණුවෙහි ප්‍රධාන අවසන් දොරටුව ලෙස විග්‍රහ වූයේ කාර්යක්ෂම බවයි. ඇතැම්හු මහා උදාසීනයෝ ය. යමක් ඇරඹීමෙහි වීර්යය ද නැත. අවසන් කිරීමෙහි වීර්යය ද නැත. සිතිවිලි පවා අලස ගති පායි. වැඩ කල් දමන්නට, වැඩ මඟ හරින්නට අතිදක්ෂ මිනිස්සු අපට සෑම තැනෙක්හිම පෙනෙත්. ඔවුන් මේ සමාජයට කොඩිවිනයකි.

එබැවින් දියුණුව කැමැත්තෝ මෙම අත්‍ථස්සද්වාර හඳුනා ගනිත්වා.



# පැළෑණේ මහානායක හාමුදුරුවෝ

(මහනාහිමි 134 වන උපත් සමරුව මේ මස 25 වන දාට යෙදිණි.)

**සිරි වජිරාරාමවාසී පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණන් විසිනි.**

දුවේ, පුතේ, වැලිවිට සරණංකර සංඝරාජ හාමුදුරුවෝ ගැන ඔබ අහල ඇති. එදා මහනුවර කාලේ බුද්ධසාසනේ සම්පූර්ණයෙන්ම පිරිහිලා උපසම්පදා භික්ෂූන්වහන්සේ පවා අපට අහිමි වූ අඳුරු යුගයක් ආවා. සාසනයේ නාමයෙන් පෙනී සිටි ගණින් වහන්සේලා ප්‍රසිද්ධියේ විවාහ ජීවිත පවා ගත කරන තරමට ම සසුන පිරිහුණා. ඒ පිරිහීම දුරු කරලා යළි පිරිසිදු උපසම්පදාව ගෙනැවිත් සිල්වත් ගුණවත් භික්ෂු සම්ප්‍රදායක් ඇති කරල යළි සසුන සුවඳ කළේ අපේ සංඝරාජ හාමුදුරුවෝ.

ඊට පසු කාලයකදී සාසනේ නැවත ලොකු පිරිහීමක් අධිරාජ්‍යවාදී බලපෑමක් සමඟ ඇති වුණා. විශේෂයෙන් දුවේ පුතේ අගනුවර මුල් කරගත් තදාසන්න ප්‍රදේශවල මේ ගැටලුව තදින් පැවතුණා. අගනුවර ප්‍රභූ පිරිස් තනතුරු නම්බු නාම උදෙසා ආගම වෙනස් කරන්න පටන් ගත්තා. භික්ෂූන් වහන්සේ ඇසුරින් දුරස් වුණා. විවිධ සංකර ගති සිරිත් ඔවුන් හරහා පැතිරෙන්න පටන් ගත්තා. ඔවුනට බුදු දහම ගැන දැනගැනීමට අගනුවර ආශ්‍රිතව ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ අඳුරු යුගයේ දී දුවේ පුතේ අද වගේ නෙවෙයි. ධර්මය හොඳට කියා දෙන්න පුළුවන් හැම දෙනාගේම ප්‍රසාදය ලැබෙන සිල්වත් ගුණවත් හාමුදුරුවරු බොහොම හිඟ වුණා. ඒත්

අපේ වාසනාවට එදා මහනුවර වගේ මෙදා කොළඹිනුත් මහා උතුමන් වහන්සේ නමක් සසුන වෙනුවෙන් පහළ වුණා. එතුමන් වහන්සේ එදා බුදුරජාණන් වහන්සේ සමයේ තිබූ අයුරින්ම වාගේ සිල්වත් ගුණවත් භික්ෂු සම්ප්‍රදායට නැවත ජීවය දුන්නා. පිරිසිදු ධර්මය සජීවී ආරකින් අපේ හදවත් වලට දැනෙන ලෙස සන්නිවේදනය කළා. ආගම ජාතිය වෙනස් කරල සසුන ගැන කළකිරීමෙන් හිටපු බොහෝ දෙනෙක් මේ මහරු පිළිවෙතට පැහැදුණා. නැවත බණ අසන්න ආවා. හරි පුදුමයක් වුණා. උපතින්ම අන්‍යාගමිකයන් පවා ඒ බණ අහල බුදු දහම වැළඳ ගත්තා. සමහරු පැවිදි වුණා. අනේ සාධු අනේ සාධු නැවත දෙව්ලොවින් දෙව් පුතෙකු පැමිණ සාසනය බේරා ගත්තා සේ සසුන බැබළෙන්න වුණා. ඒ යුග පුරුෂයාණන් වහන්සේ වෙන කවුරුත් නෙමෙයි. දරුවනේ දැන් ඔබ මේ කියවන ''බෞද්ධ ළමයා'' සඟරාව පවා ඇරඹූ බම්බලපිටියේ සිරි වජිරාරාමයේ නිර්මාතෘ වූ පරම පූජනීය පැළෑණේ සිරි වජිරඤාණ මහා නායක මාහිමිපාණන් වහන්සේ යි.

ඇත්තට පුතේ දුවේ, වජිරාරාමය නමින් විහාරයක් ඇති වුණේ එහි ධර්ම ශාලාව නිසාමයි. ඒ ධර්ම ශාලාව ඒ තරම් වටින්නේ රත්තරන් පාට ගාපු කිරිගරුඬ බිත්ති නිසාවත්, සඳුන් ලී කළුවර ලී වලින් කරපු සුගන්ධ කුටියක් නිසාවත් නෙමෙයි. පුංචි කොට බිත්ති බැඳපු ඒ චාම් ධර්ම ශාලාවෙන් විහිදුණු දහම් ආලෝකය නිසා. එදා දරුවනේ ඔයාලට අද වගේ බොහෝම ලේසියෙන් බණ අහන්න බැරි යුගයක් තිබුණා. ආච්චි අම්මල සීයල දරු මුණුපුරෝ එක්ක කොට්ට පැදුරු අරන් සියලු ගේ දොර වැඩ නවත්වලයි බණ අහන්න අවේ. හාමුදුරුවෝ පුස්කොළ පොත බලාගෙන ඒ තියෙන විදිහට තාලයට කියනවා. අහන අය කෝපි බිබී සාධු කාර දෙමින් අහනවා. සමහරු ඉතින් ගොරව ගොරවා නිදා ගන්නවා. එළි වෙන තුරු බණ කියනවා මේ ක්‍රමය ටිකක් වෙනස් කරලා ධර්මය අපේ ජීවිතවලට දැනෙන දෙයක් බවට පත් කරලා පුංචි

මාතෘකාවක් අරගෙන ශ්‍රාවකයාට සෘජුවම ආමන්ත්‍රණය කරමින් පැයක විතර කාලයක් තුළ ධර්මය ජීවිත සමග එකතු කරගන්නා හැටි බොහෝම සරලව කියා දුන්නේ අපේ පැළෑණේ සිරි වජිරඤාණ නායක හාමුදුරුවෝ. මේ අලුත් තාලේ ධර්ම දේශනා අහගෙන හිටපු එකල විද්‍යොදය පරිවේණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ 'ඔන්න දැන් තමයි ඉතින් සිංහ තෙලට රත්රන් භාජනයක් ලැබී තිබෙන්නේ'' කියා වදාර තිබෙනවාලු. ඒ විතරක් ද මහගොඩ ඤාණිස්සර නායක හාමුදුරුවෝ කිව්වලු පැළෑණෙට නම් බණ කියන පැළෑණ හරියටම අහු වී තිබෙනවා'' කියලා. අපේ මහ නායක හාමුදුරුවෝ තමයි පුතේ දුවේ ගුවන් විදුලියේ මුල්ම ධර්ම දේශනාව පවත්වපු හාමුදුරුවෝ. ඒ කාලේ ගුවන් විදුලි යන්ත්‍ර විකුණලා තිබෙන්නේ පැළෑණේ නායක හාමුදුරුවන්ගේ බණක් අහන්න ඕන නම් ගුවන් විදුලි යන්ත්‍රයක් ගන්න කියලලු. ඒ තරම්ම ඒ බණ මිනිසුන්ට වටිනා කමක් ගෙනාව. අන්තිමට මහානායක හාමුදුරුවෝ අසනීප වූ කාලයේ ගුවන් විදුලි සංස්ථාවෙන් වජිරාරාමයට වෙනම කේබලයක් සවි කළා. උන්වහන්සේගේ බණ පන්සලේ සිටම පටිගත කිරීමට. මේ ධර්ම දේශනා සම්ප්‍රදාය උන්වහන්සේගෙන් නැවතුණේ නැහැ. උන්වහන්සේ ගේ ශිෂ්‍යයානු ශිෂ්‍ය පරම්පරාවේ නාරද ලොකු හාමුදුරුවෝ, මඩිහේ මහනායක හාමුදුරුවෝ, පියදස්සි නායක හාමුදුරුවෝ අම්පිටියේ ශ්‍රී රාහුල නායක හැමුදුරුවෝ වගේම ගංගොඩවිල සෝම හාමුදුරුවොත් මේ ධර්ම දේශනා සම්ප්‍රදාය ආලෝකවත් කළා.

පැළෑණේ නායක හාමුදුරුවන්ගේ ළමා කාලය ගැන යමක් දැන ගන්න එක අපේ බෞද්ධ ළමයා කියවන පොඩිත්තන්ට බොහෝම වටී. ඔයාලා මාතර කතරගම යන කොට ගාල්ලත් මාතරත් අතර වැලිගම පහුවෙන කොට පැළෑණ කියලා මුහුද කිට්ටුව තියන ලස්සන ගමක් හම්බවෙනවා. ඒ ගමේ 1878 නොවැම්බර් 25 වනදා තමයි අපේ මහානායක හාමුදුරුවෝ උපදින්නේ. තාත්තා ප්‍රසිද්ධ

පඬිරුවනක් වූ තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම්තුමා. අම්මා ගිමාරා සේරසිංහ ළමා තැනී. දවසක් මේ පින්වත් පුංචි පුතා සිය අම්මා සමඟ පන්සලට ගියා. බුදුන් වැඳලා බෝධිය දෙස බොහෝ වෙලා බලා සිටි පුංචි පුතු ' අම්මේ අපේ බුදුහාමුදුරුවෝ මෙහෙමද බෝධිය දෙස බලාගෙන සිටියේ ' කියා ඇහුවා. අම්මාගේ ඇස්වලට සතුටු කඳුළු ආවා. අත් දෙක පුතු දෙසට එක් වුණා. පුතු දෙසට වැඳගෙනම '' පුතේ නුඹ මතු බුදුවෙයන් '' යැයි ආදරයෙන් කිව්වා. සසුන් ගමනට අම්මාගෙන් විවරණ ගත් මේ පින් ඇති පුතුගේ සිත දිනෙන් දින පැවිද්දට ම යොමු වුණා. 1893 ජූලි 20 වන දා කඹුරුගමුවේ දිවිගලහේන විහාරයේ දී වේරගම්පිට සිරි රේවත ලොකු හාමුදුරුවන්ගේ ආචාර්යත්වයෙන් පැළැණේ වජිරඤාණ නමින් පැවිදි බිමට පත්වුණා. දුවේ පුතේ '' හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ ''යැයි කියමනක් තිබෙනවා. ඒ වගේ රේවත ලොකු හාමුදුරුවන්ටත් තේරුණා සිය පා සෙවණට පත් වුණේ මහා පින් ඇති දරුවෙක් බව. රේවත ලොකු හාමුදුරුවො දවසක් මෙහෙම කියනවා. ''වජිරඤාණ පොඩි උන්නාන්සේ ගෙදරින්ම හැදී ආ කෙනෙක්. අපට ඒ නමගේ හදන්න මුකුත් ඉතිරිවෙලා නැහැ'' කියලා.

ගෙදරින්ම හැදී ආ පුංචි හාමුදුරුවෝ පන්සලෙනුත් ගොඩක් දේ ඉගෙන ගන්න ඇති. ඊට පස්සේ 1897 දී උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනට ඇතුළු වුණා. එහි දී හොඳට පාඩම් කළා. නිවාඩුවකටවත් කොහෙවත් ගියේ නැහැ. නිකරුණේ කතා කරමින් කාලය කා දැමුවේ නැහැ. අඩුවෙන් කතා කළා. වැඩියෙන් වැඩ කළා. අනෙක් පොඩි හාමුදුරුවරු විහිළු කළා කට අමතක වෙලා ගෙදර තියලා ආපු කෙනෙක් කියලා. මේ ඔක්කොම ලියන්නේ බෞද්ධ ළමයා කියවන දූ පුතුන්ට මේ උත්තම චරිතයේ ගුණ සුවඳ විඳ හැදෙන්නයි. කොහොම හරි උසුළු විසුළු ඉවසමින් වසර 03ක් තුළ පිරිවෙනේ දීප්තිමත් ශිෂ්‍යයාට හිමි '' ස්‍යාමරාජ ''ත්‍යාගයද 1900 වසරේදී දිනා ගනිමින් පිරිවෙන් අධ්‍යාපනය හමාර කළා. ඒ වසරේදීම

උපසම්පදා වූ පැළෑණේ වජිරඤාණ තරුණ හිමිපාණන් 1901 දී වජිරාරාමය ආරම්භ කළා. එදා ඉඳලා අමතක කළ කටේ බලය මතු වුණා. වජිරාරාමයේ දහම් හඬ දස දිග පැතිරුණා. පුතේ, දුවේ, එදා බම්බලපිටියේ පාරක් පාරක් පාසා හොඳට සිවුරු පොරවල හිසි රැවුල් බාලා පාත්තරේ අතට අරගෙන පිණ්ඩපාතේ වඩින හාමුදුරුවරුන් ගේ දර්ශනය බලන්න හරිම ලස්සනට තියෙන්න ඇති. හැමදාම හවසට මිනිස්සු බණ අහන්න ආවා. බණ අහල පැහැදුණු තරුණ පිරිස් පැවිදි වුණා. ඒ ශිෂ්‍ය පුත්‍රයින් වහන්සේලාත් ගුරු සමිඳු වැඩි මඟම වෙනසක් නැතිව වැඩියා. ඔබ මේ කියවන බෞද්ධ ළමයා පටන් ගත්තෙත් මේ කාලයේදීමයි. 'බෝසත්' කියලා ඉංග්‍රීසි සඟරාවකුත් පළ වුණා.

මහානායක හාමුදුරුවෝ ඔබ වගේ පුංචි දූ පුතුන්ව අමතක කළේ නැහැ. ඔබ වෙනුවෙන් ලස්සන කවි ලිව්වා. ඒ කවි කියවන කොට වචනයක් ගානේ හදවතට දැනෙනවා. ජීවිතය බලාගෙන ඉඳිද්දී හැදෙනවා. මේ බලන්න.

**"කරතොත් කරපන් හරියට- බැරිනම් පලයන් අහකට**
**අතපත ගාමිනි වටපිට - බලමින් ළත වන්නේ කුමට ද"**

"කරන දෙයක් සකසා සපුරා කැරුම
වැඩෙන පිනැතියන් සිරිතකි නිරතුරුම
තතන තතන යම්තම් ගාවා කැරුම
නිහින දුබග පිරිහෙන අයටයි උරුම"

අපේ මහානායක හාමුදුරුවෝ වයසට යද්දී ටික ටික අසනීප වුණා. උන්වහන්සේ ඒ ලෙඩ රෝග උපේක්ෂාවෙන් ඉවසුවා. සිසු පුතුන් මහත් ගෞරවයෙන් උවටැන් කළා. ඒත් එක දවසක් මුළු වජිරාරාමයම අඳුරු වෙලා ගියා. මුළු බම්බලපිටියම ඒ ආරංචිය අහල ගොළු වුණා. ගුවන් විදුලියෙන් ඒ ප්‍රවෘත්තිය අහල 'අනේ අපොයි' නොකී කෙනෙක් නැති තරමයි. අපට බණ කියන්නට දෙව් ලොව

සිට වැඩි හාමුදුරුවෝ අපට නැති වුණා' කියන වේදනාව එදා හැම දෙනාටම දැනුණා. වජිරාරාමයේ සම්බුද්ධ ශාසනයට පෑයූ පුර සඳ මඬල 1955 සැප්තැම්බර් 21 වන දා බැස ගියා. එදා සිට ශ්‍රී දේහය ආදාහනය කරන දිනය තුරු ලක්‍ෂ ගණන් සැදැහැතියන්ගේ කඳුළු වලින් වජිරාරාම භූමිය තෙත් වුණා. සිසු පුතණුවන් වහන්සේලා නැමුණු හිසින් ලෝක ධර්මතාව පිළිබඳ උපෙක්‍ෂාවෙන් සසර මග හමු වූ පරම රමණීය ඇදුරුපාණන් ගේ ශ්‍රී දේහය සහිත දෙණ ලක්‍ෂ 05ට වැඩි ජනකාය අතරින් නිදහස් චතුරස්‍රයට වැඩම කරවූවා. මේ වියෝ දුක උහුලන්න බැරිව අහස මහා කඳුළු වැස්සක් වැස්සෙව්වා. මඩිහේ මහානායක හාමුදුරුවෝ සිය ඇඳුරුපාණන් ගේ දේහය දෙස බලාගෙන ''මතු සසර සැරිසරන තුරු ඔබ වහන්සේ අපට ගුරුවරයාණන් වහන්සේ ම වේත්වා '' යි පැතුවා. දේහය චිතකයට ඇතුළු කළා. ඒ කළු දුමාරයෙන් මුළු කොළඹ අහස ම අඳුරු වුණා. පහුවදා උදේ දිනමිණ පත්‍රය මෙහෙම ලිව්වා. ''නූතන සම්බුදු සසුන් මහා සෑයේ සිළුමිණ වැටී දැවී ගියේ ය. සම්පූර්ණ ත්‍රිපිටකය අටුවා ටීකා ටිප්පණී සහිතව ලියූ ස්වර්ණමය ග්‍රන්ථ රත්නය විනයේ ජීවමාන ප්‍රතිමූර්තිය දැවී ගියේ ය''

දයාබර දුවේ පුතේ, මහානායක හාමුදුරුවෝ එදා අපවත් වුණත් ඒ උතුමන් වහන්සේ අපේ හදවත්වල ඉහළම තැන තවම වැඩ ඉන්නවා. ඒ බව මතක තබා ගෙන ඒ මහෝත්තමයන් වහන්සේ වැඩි විදුරු ඤාන මඟට යන්නට අදිටන් කරගන්න.

තෙරුවන් සරණයි.



# නොපමාව වැර දරන දියණියට

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහත්මිය**

උට්ඨාන කාලම්හි අනුට්ඨහානෝ
යුවා බලී ආලසියං උපේතෝ
සංසන්න සංකප්ප මනෝ කුසීතෝ
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති

ධම්මපද

නැඟිටින්න දුවේ වේලාව හරි
පමා වෙන්න තව නෑ සුදුසු
තරුණ කමත් බලයත් තිබුණත්
අලස වුණොත් අයියෝ ! අයියෝ !

අලස කමින් ගුළි වී උන්නොත්
සිතිවිලිත් අනේ හැංගේ ගුළි වී
හැකිළුණු මොළයෙන් කෙලෙස ද ඔබගේ
පෑදෙන්නේ නුවණේ උල්පත්

පුංචි දුවේ වැඩ කල් නො දමා
උත්සාහ අරන් දියුණුවෙ හිණි මං
නැඟ යන්න පියෙන් පිය නොපමාවී
ඔබට සියල් සැප සැදේ ඉන්

"තිමල්"

**සිරිත් මුතුහර හෙවත් ගුණ මිණි ආර - 06**



# වේලාවට වැඩ කිරීම

**“ගුරු සීයා” විසිනි**

වෙලාවට වැඩ කිරීම හොඳ ගුණයෙකි. මෙය අප පැරැණියන් පුරුදු කළ හොඳ සිරිතෙකි. අද මෙය බෙහෙවින් ඇත්තේ බටහිර රටවල ජනතාව අතර ය. හෝරා යන්ත්‍රය හෙවත් ඔරලෝසුව නිර්මාණය කැරුණේ මේ සඳහා ය. එහෙත් බොහෝ දෙනා අද එය භාවිත කරන්නේ වෙලාවට වැඩ කිරීමට නොව ආභරණයක් ලෙස සලකා ය.

පොදු කටයුතුවල යෙදෙන විටත් පෞද්ගලික කටයුතු කරන විටත් වෙලාවට කරන්නට පුරුදු වීම සාධූන් ගේ සිරිතෙකි. ‘සිරිමත්’ ගේ දින චරියාවේ දී තමාට අයත් කටයුතු වෙලාවට සිදු කළ බව එම කවි පෙළෙහි දැක්වෙන්නේ මෙසේ යඃ

“වෙලාව නො වැරැද - කෑමට ආ සඳ
ඔහුට වඩා සොඳ - මහතෙක් කවරෙ ද?

යන පැදිය කුඩා දරුවනට මැනැවින් කට පාඩම් ය.

වෙලාව නො සලකන අය කාලය නාස්ති කරති. ඇතැම් විට තමා ගේ කාලය පමණක් නො ව අනුන් ගේ කාලය ද නාස්ති කරති. සමිතියක, ආයතනයක, රටක හෝ වෙලාවට

වැඩ නොකරන නිළධාරීන් රාජ්‍ය නායකයන්, ප්‍රධානීන් ප්‍රමාද ව වැඩ කරන විට රට ම පිරිහෙන සැටි පසුගිය කාලයෙහි අපි අත්දුටුවමු. අන්තර් ජාතික වශයෙන් ද අප - කීර්තියක් එයින් ලැබිණි.

ප්‍රමාද වී වෙලාවට වැඩ නොකිරීම ''සිංහලයා ගේ වෙලාව යැ'' ඇතැමෙක් කියති. එය සිංහල ජාතියට ම කැරෙන අපහාසයෙකි. පෙරදිග වැසියන් වෙසෙසින් ම සිංහලයන් සුභ නැකතට වැඩ කිරීමෙන් පුහුණු කෙළේ ද වෙලාවට වැඩ කිරීමට ය. පැරැණි සිංහලයන් කාලය නාස්ති නොකර වෙලාවට වැඩ කළ බව රොබට් නොක්ස් ආදීන් ලියූ පත් පොත්හි ද සඳහන් වේ.

**"ගුරු සිත නො රිදවා**
**වෙලාව නො වරදවා**
**බැති පෙම් උපදවා**
**අකුරු උගනී කුමරු සොඳවා"**

එදා රජ කුමරකු වෙලාව නො වරදවා ශිල්ප උගත් සැටි තොටගමුවේ ශ්‍රී රාහුල මා හිමියන් ''කාව්‍යශේඛරයෙහි'' සඳහන් කෙළේ එ ලෙසිනි.

බුදුරජාණන් වහන්සේ ද වෙලාවට සැලැසුමකට අනුව වැඩ කිරීමේ ආදර්ශය ලොවට පෙන්වූ උතුම් ශාස්තෲන් වහන්සේ කෙනෙකි. හොඳ දරුවෝ ඒ බුදු සිරිත හොඳින් අනුගමනය කරති. බෞද්ධ ළමයාට පසු කාලයෙක ''මහාත්මයකු'' මහාත්මනියක'' වන්නට මේ උතුම් සිරිත මහත් උපකාරයක් සලසන්නේ ය. අපේ හොඳ දරුවෝ ''සිංහලයාගේ වෙලාව'' (ප්‍රමාද වී වැඩ කිරීම) වෙනස් කරන්නට උත්සාහවත් වෙත් වා!

වෙලාවට වැඩ කිරීමේ අගය විදහා දක්වන, පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් ගේ පහත සඳහන් මනරම් කවිය ද හොඳින් ප්‍රගුණ කරන්න.

**වෙලාවට ම හැම කටයුතුවල යෙදෙනු**
**නොලා කල් පටන් ගත් කටයුතු නිමනු**
**මලා නික දුමුක නොවැ හුරු බුහුටි වනු**
**බලා මතු දියුණු සිහියෙන් මෙහෙ කරනු''**

සියලු දරුවෝ සුවපත් වෙත් වා !

**මා මෙ කදාචි පාපිච්ඡො**
**කුසීතො හීනවීරයො**
**අප්පස්සුතො අනාදරො**
**කෙන ලොකස්මිං කිං සියා**

**සාරිපුත්තථෙරගාථා**

පාපී ආශා ඇත්තෙක්, වීර්ය නැත්තෙක්, කම්මැලියෙක්, අල්පශ්‍රැතයෙක්, දයා නැත්තෙක් කිසි කලෙක මට හමු නො වේ වා! එබඳු කෙනෙකුගේ අවවාදයෙන් කවර ප්‍රයෝජනයක් ද?

"යමෙක් බහුශ්‍රැත ද ප්‍රඥා සම්පන්න ද ශීලයෙහි මැනැවින් පිහිටියේ ද, සිත වැඩීමෙහි (සමථයෙහි) යෙදුණේ ද හෙතෙම මාගේ මුඳුනෙහි පවා සිටී වා! (හිස් මුඳුනින් ඔහුට ගෞරව කරමි)

**සාරිපුත්තථෙරගාථා**



# බක ජාතකය

විශාඛා විද්‍යාලයයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ යම්කිසි විහාරස්ථානයක ද, එම විහාරය බොහෝ ජනයාගෙන් මෙන්ම සංඝයා වහන්සේලාගෙන් ද පිරී ගියේ ය.

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටින කල එම විහාරය ද සැමවිට ම සැදැහැවතුන්ගෙන් පිරී පැවැතිණ. බුදුරජාණන් වහන්සේගෙන් බණ ඇසීමට, බොහෝ දුර සිට වැඩම කළ එක් භික්ෂුවක් විය. මෙම භික්ෂුව තම සිවුර මනාව පොරවාගෙන සිටියේ ය. කිසිවෙක් එය පරණ වූ සිවුරක් බව දැන නොගත්හ. අනෙක් භික්ෂූන් හට මේ සිවුර මනා ලෙස පොරවා ගැනීමට හැකි නිසා ඉල්ලා ගැනීමට සිතූහ. දුකසේ ලබාගෙන පරිස්සම් කරගත් මේ සිවුර දෙන්නේ කෙසේදැයි පැවසූ භික්ෂුව, අලුත් සිවුරකට මෙය මාරු කරන්නට කැමති විය. මෙසේ සිවුරු හුවමාරු කරගත් පසු අනෙක් භික්ෂූහු පරණ වූ සිවුර සේදූහ. එය පරණ වූ සිවුරක් බැවින් භික්ෂූන් එය සේදූ විට ඉරී ගියේ ය. තමන් හට සත්‍යය නොපවසා, රවටන්නට හැදූ බව බුදුරජාණන් වහන්සේට භික්ෂූහු පැමිණිලි කළහ. පෙර ආත්මවල දී පවා මෙම භික්ෂුව නොයෙක් අය නොමඟ යවා ඇති බව පවසා ඒ අතීත කථාව වදාළහ.

ඈත අතීතයේ බරණැස් නුවර බඹදත් රජු කල අප මහ බෝසතාණන් වහන්සේ මාළු රැනක නායකයා ලෙස එක් විලෙක ජීවත් වූහ. ඔවුනට මුහුණ දීමට තිබූ එකම ගැටලුව කොකුන්ගෙන් ආරක්ෂා වීම ය. විලෙහි පිරී තිබු සුදු නෙළුම් මල් සහ කොළ මාළුවනට ආරක්ෂාව ගෙන දුනි. එක් දිනෙක විලට පැමිණි කොකෙකු තම පියාපත් විහිදුවා, සුදු නෙළුම් මල් අතරට වී නෙළුම් මලක් ලෙස සිටියේ ය. මෙම කොකා සිල්වත් අයෙකු විය යුතු බව මාළුවෝ සාකච්ඡා කළහ. මෙය කන වැකුණු නායක මාළුවා ''සහෝදරයිනි, කොකා නෙළුම් මලක් ලෙස සිටින්නේ සිල්වත් කමට නොවේ. ඔබ සැම අල්ලා ගැනීමට අවස්ථාවක් එනතුරු බව නොතේරේදැයි විමසී ය. එය පිළිගත් මාළුවෝ විලේ ඒ මේ අත පීනමින් විල කළඹන්නට වූහ. විලේ ජලය මඩවිය. දුඹුරු පැහැයට හැරුණි. දිය යට සිටි මාළු නොපෙනී ගියෝ ය. කොකාට තවදුරටත් මාළුන් රවටන්නට නොහැකි විය. නායක මාළුවාගේ නුවණැති කම නිසා මිතුරු මාළු රැන රැකුණි. නෙළුම් මලක් ලෙස රඟ පෑ කොකා ඈත වනයට පියාඹා ගියේ විලක් සොයාගෙන ය.

එකල නායක මාළුවා වූයේ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. මාළු රැන සංඝයාවහන්සේලා ය. මාළුන් රැවටීමට තැත් කළ කොකා භික්ෂුන් වහන්සේලාට සත්‍යය නොපැවසූ භික්ෂුවයි. අනුන් රවටන්නට සිතීම පවා හොඳ නැත. එවිට තමාම කරදරයට පත්වෙන බව බක ජාතකය අපට කියා දේ.



# සූත්‍ර පිටකයෙනි.......

රාහුලයෙනි, යම්සේ රජකුට රියහිස් පමණ දළ ඇති, වැඩුණ ශරීර ඇති, ජව සම්පන්න 'යුද්ධභූමියට අවතීරණ වූ ඇතෙක් වෙයි ද, ඔහු යුද්ධභූමියට අවතීරණ වූයේ, ඉදිරි දෙපා වලින් ද ක්‍රියා කරයි. පසු දෙපා වලින් ද ක්‍රියා කරයි. ඉදිරි ශරීරයෙන් ද ක්‍රියා කරයි. පසු ශරීරයෙන් ද ක්‍රියා කරයි. හිසින් ද ක්‍රියා කරයි. දෙකන්වලින් ද ක්‍රියා කරයි. දළ දෙකින් ද ක්‍රියා කරයි. වලිගයෙන් ද ක්‍රියා කරයි. සොඬය රැකගනී. එහි දී ඇතුරුවාට මෙවන් සිතක් පහළ වෙයි. ''රජුගේ මේ ඇත් රජ රියහිස් පමණ දළ ඇති...... සොඬය රැකගන්නේම ය. ඇතා ගේ ජීවිතය රජු වෙනුවෙන් හරනා ලද්දේ ය''.

රාහුලයෙනි, රජුගේ ඇතා රියහිස් පමණ දළ ඇති.......... සොඬින් ද ක්‍රියා කරයි. එහි දී ඇතරුවාට මෙවන් සිතක් පහළ වෙයි. ''රජු ගේ මේ ඇතා......... ඇතාගේ ජීවිතය රජු වෙනුවෙන් පරිත්‍යාග කරන ලද්දේ ය. එසේ ඇති විට ඇතා විසින් රජුට වෙන කිසි කටයුත්තක් නැත''යි . එලෙසම රාහුලයෙනි, යම් කිසිවකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජා නැද්ද, ඔහු විසින් කිසි පාපකර්මයක් නො කළ හැකි යයි මම නො කියමි. එම නිසා මෙහි දී, රාහුලයෙනි, සෙල්ලම් පිණිස ද බොරු නො කියමි. රාහුලයෙනි, මෙලෙස තොප විසින් හික්මිය යුතු ය.

**- අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍ර ය**



*From :Dhammapada – V 44 & V 45*

# FIVE HUNDRED MONKS ADVICED BY THE BUDDHA

Compiled by
**Srima Warusawithana**

Five Hundred monks, they journeyed on with the Buddha taking the lead,

To a village far beyond; then back to the monastery

Gifted by Anathapindika – Feeder of the poor;

Weary, they rested awhile and later in the Audience Hall

Grouping together each discussed the path they took along the way;

Some spoke about the nature of the road, hilly, level and such like,

Others about the sandy or clayey soil, red or black;

Each according to the manner in which they saw the landscape:

The Buddha approaching the monks realizing what their conversation was about,

Superficial and external it all seemed to be, uttered thus:

"It is well O' monks to think of your own body which is impermanent, subject to decay,

Better by far that you should concentrate on this with mental exercise and poise;

For he that comprehends this world of men and gods,

And is well taught in the Dhamma, is like one who is skilled picks a flower

To make a beautiful garland."